ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2026
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2026

| 13 ශ්‍රේණිය | 29 | S | I | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I<br>Communication & Media studies | කාලය : පැය දෙකයි<br>Time : Two hours |
|---|---|---|---|---|---|

උපෙදස් :

- ❖ සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- ❖ වඩාත් නිවැරදි හෝ ඉතාමත් ගැළෙපන පිළිතුර තෝරන්න.

---

01. කාව්‍යකරණයෙහි දක්ෂයෙකු වූ සඳරු තම සිතට නැඟුණු කවි සංකල්පනාවක් වචන බවට හරවා කවියක් රචනා කළේ ය. මෙම කාර්යය මාධ්‍ය අධ්‍යයනයට අනුව,

1. සංකල්ප රචනයකි. 2. අත්දැකීම් ප්‍රතිනිර්මාණයකි. 3. ආකේතකරණයකි.
4. විකේතකරණයකි. 5. නිර්මාණකරණයකි.

02. පොදු අරමුණකට අනුව ඒකරාශී වන , නායකත්ව හා අනුගාමිකත්ව ලක්ෂණ ප්‍රබලව දක්නට ලැබෙන සන්නිවේදන වර්ගය වන්නේ,

1. සමූහ සන්නිවේදනයයි. 2. මහජන සන්නිවේදනයයි. 3. අතරා සන්නිවේදනයයි.
4. ජන සන්නිවේදනයයි. 5. කථන සන්නිවේදනයයි.

03. මාධ්‍ය සංදේශ ඇගයීම් උළෙලක දී ඇගයීම් කරුවෙක් ටෙලිනාට්‍යයක් කොටස් කිහිපයකට වෙන් කර ගනිමින් එක් එක් කොටසෙහි සාර්ථක අසාර්ථක බව වෙන වෙන ම විමසා බැලී ය. මෙය සංදේශයක්,

1. විචාරයකි. 2. විශ්ලේෂණයකි. 3. තක්සේරුකරණයකි.
4. ඇගයීමකි. 5. කාණ්ඩකරණයකි.

04. රටක් සංවර්ධනය කරා ගෙන යාමේ දී ද්‍රව්‍යමය සංවර්ධනයක් නොව මානව සංවර්ධනයක් සිදු කළ යුතු බව ප්‍රකාශ කළේ,

1. එඩ්ගා ඕවන්ස් ය. 2. ඩඩ්ලි සියර්ස් ය. 3. මහත්මා ගාන්ධි ය.
4. විල්බර් ශ්‍රාම් ය. 5. එවරට් එම්. රොජර්ස් ය.

05. රජය සිදු කිරීමට අපේක්ෂිත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහන පිළිබඳව සමූහ සන්නිවේදනය ඔස්සේ දැනුම්වත් කිරීමට අමතරව අධ්‍යාපන බලධාරීන් විසින් ජනමාධ්‍ය යොදා ගනිමින් අවධාරිත බලපෑමකින් යුතුව ජනතාවට පැහැදිලි කළේ ය . HUB ආකෘතියට අනුව මෙය,

1. නියාමනයකි. 2. දොරටුපාලනයකි. 3. මාධ්‍ය විස්තාරණයකි.
4. බලපෑමකි. 5. ප්‍රතිපෝෂණයකි.

06. නිදහස් කාලච්ඡේදයක දී එක් සිසුවෙක් පන්තිය ඉදිරියට ගොස් අභිරූපණයක් සිදු කළ අතර සෙසු සිසුහු එය නරඹමින් සිනාසුණ හ. මේ අවස්ථාවේ දක්නට ලැබෙන සන්නිවේදන ස්වරූපය වන්නේ,

1. කණ්ඩායම් සන්නිවේදනයයි. 2. සමූහ සන්නිවේදනයයි. 3. අවිධිමත් සන්නිවේදනයයි.

Past Papers Wiki

4. නිර්වාචික සන්නිවේදනයයි. 5. අන්තර් පුද්ගල සන්නිවේදනයයි.

07. ගැමි ජනතාවගේ ශ්‍රම ක්‍රියාකාරීත්වය සමඟ බැඳුණු සංස්කෘතික ප්‍රභේදය වන්නේ,

1. ජනප්‍රිය සංස්කෘතියයි. 2. ජන සංස්කෘතියයි. 3. සාම්ප්‍රදායික සංස්කෘතියයි.

4. සම්භාව්‍ය සංස්කෘතියයි. 5. ගැමි සංස්කෘතියයි.

08. ජනකථා පිළිබඳ ව ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A. ජන විඥානය පිළිබිඹු කරයි.
B. සමාජානුයෝජන ක්‍රමවේදයක් ලෙස යොදා ගෙන ඇත.
C. එක් පරපුරකට පමණක් සීමා විය.
D. සත්‍ය මෙන් ම මිත්‍යා චරිත ද යොදා ගෙන ඇත.
E. නියත කර්තෘත්වයක් දක්නට ලැබේ.

මේ අතරින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

1. A,B,C පමණි. 2. B,C,D පමණි. 3. A,B,D පමණි.

4. A,B,C,D පමණි. 5. A,B,C,D,E යන සියල්ලම.

09. පහත සිදුවීම් වලට ගැළපෙන පිළිතුරු කාණ්ඩය තෝරන්න.

අ. උසස් පෙළ කලා විෂයය ධාරාවෙන් මාධ්‍ය අධ්‍යයනය විෂයය තෝරාගත් හිරුණිගේ ඉලක්ක වූයේ මාධ්‍යවේදිනියක් වීමයි.

ආ. ඇය සන්නිවේදනය විෂයය සඳහා අවශ්‍ය තොරතුරු විවිධ මාධ්‍ය හා සම්පත් පුද්ගලයින් හරහා ලබා ගනිමින් මතකයෙහි ගොනුකර ගත්තා ය.

ඇ. මාධ්‍යවේදිනියක් වීමට අවශ්‍ය කථන, නිවේදන, ලේඛන, සංදේශ සකස් කිරීම් හා ඉදිරිපත් කිරීමේ පුහුණු වීම් වල නිරත විය.

1. ස්වයං නිර්ණය, ප්‍රජානනය, කුසලතා
2. ස්වාධීනත්වය , අධ්‍යාපනය, පුහුණුව
3. ස්වයං විශ්වාසය, ඥානනය, කුසලතා
4. ස්ව කේන්ද්‍රය, ප්‍රජානනය, නිපුණතා
5. ස්ව කේන්ද්‍රය, ඥාන ව්‍යුහ, කුසලතා

10. මහාචාර්ය විල්බර් ශ්‍රාම් සන්නිවේදන ක්ෂේත්‍රයට සිදු කළ මෙහෙවරට අයත් නොවන්නේ,

1. ඉලිනොයිස් විශ්ව විද්‍යාලයේ දී සන්නිවේදනය ස්වාධීන විෂයයක් ලෙස ඇරඹීම.

2. සන්නිවේදන අත්පොත, ජනසන්නිවේදනයේ විපරිණාමය, ජනසන්නිවේදනයේ සමාජ බලපෑම වැනි ග්‍රන්ථ රැසක් සන්නිවේදන ක්ෂේත්‍රයට එක් කිරීම.

3. සන්නිවේදනය සම්බන්ධ පර්යේෂණ රැසක් සිදු කිරීම.
4. ශ්‍රී ලංකාව ඇතුළු රටවල් රැසක සන්නිවේදන විෂයය ආරම්භ කර පෝෂණයට දායක වීම.
5. සංවර්ධන සන්නිවේදන සංකල්පය බිහි කිරීමට පුරෝගාමී වීම.

11. “සංස්කෘතියේ විද්‍යාත්මක න්‍යායන්” නමින් කෘතියක් 1944 දී සම්පාදනය කරමින් සංස්කෘතිය පිළිබඳ සංකල්පීය මතවාද රැසක් ඉදිරිපත් කළේ,

1. ඊ.බී. ටයිලර් ය. 2. බී. මැලිනොව්ස්කි ය. 3. මාර්කස් පර්සියස් කැටෝ ය.

4. මාකස් ටුලියස් සිසරෝ ය. 5. සැමුවෙල් පුෆෙන්ඩෝෆ් ය.

12. බටහිර රටක සිට උසස් අධ්‍යාපනය සඳහා මෙරටට පැමිණි විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙක් ට භාෂාව පමණක් නොව ආහාර පාන, හැසිරීම්, ඇවතුම් පැවතුම් ඇතුළු සියලු අංශ තම රටට වඩා මුළුමනින් ම වෙනස් බව අවබෝධ විය. ඔහුට අපගේ සිසුන් සමඟ සහයෝගයෙන් විසීම සඳහා හැදෑරීමට ඔබ යෝජනා කරන විෂයය ක්ෂේත්‍රය තෝරන්න.

1. මානව විද්‍යාව 2. අන්තර් සංස්කෘතික අධ්‍යයනය 3. මනෝ විද්‍යාව
4. මහජන සම්බන්ධතාව 5. භාෂා පරිවර්තන අධ්‍යයනය

13. යුනෙස්කෝ සංස්කෘතික ප්‍රඥප්තියට අනුව අස්පර්ශ්‍ය සංස්කෘතික උරුමයන් අතරට අයත් නොවන්නේ,

1. රූකඩ ය. 2. ලී කැටයම් ය. 3. ඇදහිලි විශ්වාස
4. සිරිත් විරිත් ය. 5. සාහිත්‍ය ය.

14. නිර්මාණාත්මක කාර්යයේ දී ජනශ්‍රැති හා ජනකලා භාවිතය පිළිබඳ ව කරුණු කිහිපයක් පහත දැක්වේ.

A- ජන විඥානයට සමීප වීම.
B- ග්‍රාහක ආකර්ෂණය වර්ධනයට සමත් වීම.
C- සංඥා සංකේත ග්‍රහණයට පහසු වීම.
D- නිර්මාණය කෙරෙහි ඉහළ විශ්වාසයක් ගොඩනඟා ගත හැකි වීම.

මේ අතරින් ජනකලා භාවිතයේ වැදගත්කම් අතරට අයත් වන ප්‍රකාශ වන්නේ ,

1. A, B පමණි. 2. A,B,C පමණි. 3. A,B,D පමණි.
4. B,C,D පමණි. 5. A,B,C,D යන සියල්ලම අයත් ය.

15. පහත කරුණු අතරින් පුවත් නියෝජිත ආකෘතිය පිළිබඳ නිරවද්‍ය ප්‍රකාශය අන්තර්ගත වරණය තෝරන්න.

1. සන්නිවේදනය මඟින් සැඟවීමක් නොකළ යුතුය යන්න අවබෝධ වීම.
2. ප්‍රවර්ධනය තුළින් අතිශයෝක්තියට මුල් තැන ලැබීම හා සත්‍යයට දෙවැනි තැන ලැබීම.
3. අලෙවිකරණ සන්නිවේදනය ඉලක්ක ග්‍රාහකයන් මත ක්‍රියාත්මක වීම.
4. විද්‍යාත්මක පෙළඹවීම් පිළිබඳ අධ්‍යයනය වර්ධනය වීම.
5. ප්‍රයෝගකාරී ප්‍රචාරණ සංවිධාන වෙනස් විය යුතු බව අවබෝධ වීම.

16. ඔබ ABCD නම් ව්‍යාපාර ජාලයේ මහජන සම්බන්ධතා නිළධාරියා නම් ඔබට ව්‍යාපාරයේ මහජන සම්බන්ධතාව ඉහළ අදියරකට නැංවීමට ගත හැකි උපක්‍රම අතරට අයත් නොවන ප්‍රකාශය තෝරන්න.

1. වෙළෙඳ ප්‍රදර්ශන පැවැත්වීම. 2. වෙළෙඳ වට්ටම් ලබා දීම.
3. මාධ්‍ය සම්බන්ධතා පැවැත්වීම. 4. අනුග්‍රාහකත්වය ලබා දීම.
5. චර්යා ධර්ම පද්ධති සැකසීම.

17. සහභාගීත්වය හා පුද්ගලාන්තර සම්බන්ධතා ශක්තිමත් කිරීම සංවර්ධනය හා සන්නිවේදන අවශ්‍යතාවයකි. ඒ සඳහා සිදු කළ යුතු කාර්යයන් අතරට අයත් වන්නේ,

1. කාන්තාවන් හා ගැහැණු ළමුන් අතර සංස්කෘතික වශයෙන් සංවේදී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
2. සාධාරණත්වය ,විවිධත්වය හා ඉවසීම දියුණු කිරීම.
3. දුප්පත් ම කණ්ඩායම් ක්‍රියාශීලී ව සහභාගී කරවීම.
4. විවිධ මාධ්‍ය වලට පුළුල් මහජන ප්‍රවේශයක් සැකසීම.
5. මහජන කතිකාව දිරිගන්වන පාරදෘශ්‍ය හා වගකිව යුතු පාලන ක්‍රමයක් සැකසීම.

18. දිට්වා සුළි කුණාටුව අවස්ථාවේ දී වගේ ම විවිධ ව්‍යසන ආපදා වලින් රටවැසියන් ආරක්ෂා කර ගැනීම සඳහා ජනමාධ්‍ය නිරන්තරයෙන් ප්‍රබල අවධානයක් යොමු කරන ලදි . විල්බර් ශ්‍රාම් ට අනුව ජනමාධ්‍යයේ මෙම කාර්යය භාරය,

1. සාකච්ඡා මණ්ඩපයක භූමිකාවයි. 2. සමාජ උරුමය අඛණ්ඩව ව්‍යාප්ත කිරීමයි.
3. සුපරීක්ෂණ කාර්යයයි. 4. ආරක්ෂකයෙකුගේ භූමිකාවයි.
5. ගුරුවරයෙකුගේ භූමිකාවයි.

19. අන්තර්ජාලය නව මාධ්‍යයක් ලෙස හැඳින්වීමට බලපාන වඩාත් ම ගැළපෙන පිළිතුර වන්නේ,

1. ජනමාධ්‍ය වලින් පසුව බිහි වූ මාධ්‍යයක් වීමයි.
2. පශ්චාත් නූතන යුගය තුළ බිහි වූ මාධ්‍යයක් වීමයි.
3. ජාලගතව වේගවත් ව තොරතුරු හුවමාරුව සිදු වීමයි.
4. ජනමාධ්‍යයට වඩා ආකර්ෂණීය මාධ්‍යයක් වීමයි.
5. නව තාක්ෂණයක් යොදා ගැනීමයි.

20. ගෝලීය සංස්කෘතිය යන අදහස මුලින් ම හඳුන්වා දෙනු ලැබුයේ,

1. ජෝන් මැක්ලීන් ය. 2. බී. මැලිනොව්ස්කි ය. 3. රොබට්සන් ය.

4. මාෂල් මැක්ලූහන් ය. 5. වෝල්ටර් බෙන්ජමින් ය.

21. මාධ්‍ය සාක්ෂරතාව යනු මාන ගණනාවකින් යුතු සංකල්පයකි. පහත පිළිතුරු අතරින් ඥාන ව්‍යුහ සැකසීමට තොරතුරු ලැබෙන මානයන් අතරට අයත් නොවන්නේ,

1. සංජානන මානයයි. 2. සංවේදී මානයයි. 3. චිත්තවේගීය මානයයි.

4. සෞන්දර්යාත්මක මානයයි. 5. සදාචාරාත්මක මානයයි.

22. පහත වගුවෙහි දක්වා ඇත්තේ නියාමන ආයතන කිහිපයක් හා එවැනි ආයතන වලින් සිදු කළ හැකි කාර්යයන් කිහිපයකි.

| | නියාමන ආයතනය | | කාර්යයන් |
|---|---|---|---|
| A | ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය | 1 | පුවත්පත් ලිපියක ප්‍රසිද්ධ පුද්ගලයෙකුගේ නමක් වැරදි ලෙස පළවීම ගැන දැන්වීමට |
| B | ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය | 2 | ඔබේ සමාජ මාධ්‍ය ගිණුම් Hack කොට මුදල් කොල්ලකෑම ගැන පැමිණිලි කිරීමට |
| C | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | 3 | සදාචාර නොවන ප්‍රසංගයක් වලක්වා ගැනීමට |
| D | ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිෂන් සභාව | 4 | අලුතෙන් ආරම්භ කරන ගුවන් විදුලි ආයතනයට සංඛ්‍යාත පද්ධතිය ලබා ගැනීම. |
| E | ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය | 5 | ආචාරධර්ම බරපතල ලෙස උල්ලංඝනය කළ පුවත්පත් දැන්වීමක් පිළිබඳ පැමිණිලි කිරීමට |

ඉහත ආයතන හා කාර්යයන් එකිනෙක ගැළපූ විට වඩාත් නිවැරදි පිළිතුර ඇතුළත් වරණය වන්නේ,

1. A2, B5, C4, D1, E3 2. A3, B5, C2, D4, E1 3. A4, B1, C3, D5, E2

4. A3, B1, C4, D5, E2 5. A3, B5, C4, D1, E2

23. ලෝකයේ ප්‍රථම වරට තොරතුරු ලබා ගැනීමේ නීති සම්මත වූයේ 1766 දී ය. ඒ කවර රටක ද?

1. ඇමෙරිකා එක්සත් ජනපදයයි. 2. ස්වීඩනයයි. 3. මහා බ්‍රිතාන්‍යයයි.

4. බ්‍රසීලයයි. 5. ජපානයයි.

24. යටත් විජිත සමයේ දී මෙරට චිත්‍රපට ගොඩනැඟූ ආයතනය වන්නේ,

1. ලයිකා ප්‍රඩක්ෂන් ආයතනයයි. ( LYCA PRODUCTION )
2. රජයේ චිත්‍රපට අංශයයි. ( GOVERNMENT FILM UNIT )
3. ජාතික චිත්‍රපට සංස්ථාවයි. ( NATIONAL FILM CORPORATION )

4. ලංකා සිනමා මණ්ඩලයයි. ( CEYLON THEATRES )
5. එම්.පී. අයි. තියටර්ස් ය. ( M.P.I. THEATRES )

25. එක්තරා ජනමාධ්‍ය ආයතනයක් තම ප්‍රධාන විකාශනයට අමතර ව ඉලක්කගත ප්‍රජාවක් වෙනුවෙන් විනෝදාත්මක වැඩසටහන් ඇතුළත් YOU TUBE නාලිකාවක් ඇරඹී ය . මෙම අවස්ථාවට වඩාත් ගැළපෙන පිළිතුර වන්නේ,

1. නිර්මහාපරිමාණකරණයයි. 2. කාණ්ඩකරණයයි. 3. විභේදනයයි.

4. කුඩා කණ්ඩායම් සන්නිවේදනයයි. 5. සමූහ සන්නිවේදනයයි.

26. වෙළෙඳ දැන්වීම් කර්මාන්තය පදනම් කරගෙන මාධ්‍ය නිෂ්පාදන , මාධ්‍ය ආයතන සේවකයන්, මාධ්‍ය ව්‍යුහය මෙන් ම මාධ්‍ය පද්ධතියේ ක්‍රියාකාරීත්වය ද ආර්ථික වශයෙන් සවිබල ගැන්වේ. නව මාධ්‍ය ප්‍රවණතා වලට අනුව මෙය,

1. භාණ්ඩකරණයයි. 2. අභිසරණතාවයයි. 3. ගෝලීයකරණයයි.

4. වාණිජකරණයයි. 5. පාරිභෝජ්‍යකරණයයි.

27. එක්තරා සමීක්ෂකයෙක් විසින් සුමුදුරු ග්‍රාමයේ රූපවාහිනී මාධ්‍ය සම්බන්ධව සමීක්ෂණයක් කිරීමට සිතා මුලින් ම ග්‍රාම නිලධාරී කාර්යාලයට ගොස් ගමෙහි පවුල් සංඛ්‍යාව කොපමණ ද යන්න තොරතුරු ලබා ගත්තේ ය. ඉන්පසු ඔහු ගෙන් ගෙට ගොස් ප්‍රශ්නාවලියකට අනුව දත්ත රැස් කිරීම ඇරඹී ය. මෙහි දී භාවිතා වූ දත්ත වර්ග වන්නේ,

1. සංඛ්‍යාත්මක හා ගුණාත්මක දත්ත 2. ගුණාත්මක හා සංඛ්‍යාත්මක දත්ත

3. ප්‍රමාණාත්මක හා ප්‍රාථමික දත්ත 4. ද්විතියික හා ගුණාත්මක දත්ත

5. ගුණාත්මක හා ද්විතියික දත්ත

28. සමීක්ෂණ ක්‍රියාවලියක පියවර කිහිපයක් පහත දැක්වේ.

A- මාතෘකාව තීරණය කිරීම.
B- දත්ත විශ්ලේෂණය කිරීම.
C- ගැටලුව හඳුනා ගැනීම.
D- අරමුණු හඳුනා ගැනීම.
E- දත්ත රැස් කිරීම.

ඉහත පියවර නිවැරදි අනුපිළිවෙළට සැකසූ වරණය වන්නේ,

1. C,A,D,B,E 2. D,A,C,E,B 3. D,C,A,E,B 4. C,D,A,E,B 5. C,E,D,A,B

- පහත දැක්වෙන සන්නිවේදන මූලිකාංග ඇතුළත් වගුව හොඳින් අධ්‍යයනය කර ප්‍රශ්න අංක 29 සිට 32 දක්වා ප්‍රශ්න වලට ඒ ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| A | සන්නිවේදක | E | ආකේතකරණය | I | බලපෑම | M | සම්ප්‍රේක්ෂණාගාරය |
| B | සංදේශය | F | විකේතකරණය | J | සන්දර්භය | N | අවස්ථාව |
| C | මාධ්‍යය | G | ප්‍රතිපෝෂණය | K | තොරතුරු මූලාශ්‍රය | | |
| D | ග්‍රාහකයා | H | බාධක/ ඝෝෂාව | L | අර්ථකථනය | | |

29. ඉහත මූලිකාංග අතරින් සන්නිවේදනය ක්‍රියාවලියක් වීමට බලපාන ප්‍රධාන මූලිකාංග වනුයේ,

1. A, E, F, C 2. A, B, C, D 3. K, A, B, D

4. K, B, C, D 5. A, B, D, I

30. සන්නිවේදනය චක්‍රීය ක්‍රියාවලියක් වීමට හා සන්නිවේදන ක්‍රියාවලියට ග්‍රාහකයාවත් සම්බන්ධ කර ගැනීමට ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතිය තුළ හඳුන්වා දී ඇති මූලිකාංගය වන්නේ,

1. G ය. 2. B ය. 3. E ය. 4. F ය. 5. L ය.

31. සාමාන්‍ය පුද්ගල මනස තුළ සිදු වන ආකේතකරණ ක්‍රියාවලියට සමාන ක්‍රියාවලියක් විද්‍යුත් සන්නිවේදනයක් තුළ ද සිදු වන ආකාරය දැක්වීමට ෂැනොන් හා වීවර් ආකෘතියේ දක්වා ඇති මූලිකාංගය වන්නේ,

1. M ය. 2. F ය. 3. G ය. 4. I ය. 5. E ය.

32. සචිත නව මාධ්‍ය තුළ සැරිසරණ විට මත් ද්‍රව්‍ය වල ආදීනව හා ඉන් මිදෙන ආකාරය ඇතුළත් වීඩියෝ පටයක් දුටුවේ ය. මත් ද්‍රව්‍යට ඇබ්බැහි වී සිටින තම මිතුරන් කිහිප දෙනෙකුට එම සංදේශය යැවිය යුතු බව ඔහු සිතුවේ ඔවුන් ඉන් මුදවා ගැනීමට තරම් ආකල්පමය හා හැසිරීමේ වෙනසක් කළ හැකි මට්ටමක් එහි පැවතීමය. නමුත් සචිත ඒ මොහොතේ යැවූ පණිවිඩය මිතුරන්ට ගත නොහැකි වූයේ ඔවුන් සිටි තැනට දුරකථන සංඥා ( SIGNAL) නොමැති වීම නිසා ය.

ඉහත අවස්ථා වලට ගැළපෙන මූලිකාංග පිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.

1. A, C, B, D, I, H 2. A, B, C, D, J, H 3. A, B,D,I,H,C

4. A, B, D, J, C, H 5. A, C, I, D, H, M

33. සංවර්ධනය පිළිබඳ මධ්‍ය යුගයේ දී එවරට් එම්. රොජර්ස් විසින් සංවර්ධන සංකල්පයට නව එළඹුමක් ලෙස හඳුන්වා දුන් න්‍යාය වනුයේ,

1. පරායත්තතා න්‍යායයි. 2. නවීකරණ න්‍යායයි. 3. නවෝත්පාදන විසරණයයි.

4. ප්‍රමුඛ සුසමාදර්ශයයි. 5. විකල්ප සුසමාදර්ශයයි.

34. පහත දැක්වෙන්නේ මහජන සම්බන්ධතා කාර්යයන් කිහිපයකි. එක් එක් කාර්යය සඳහා උපයෝගී කරගත හැකි මෙවලම් හා විධික්‍රම ඇතුළත් පිළිතුරු කාණ්ඩය වන්නේ

- වසරේ හොඳම සේවකයා තේරීම.
- තම ආයතනයේ සියලු ශාඛා මේ ඉරිදා දිනයේත් විවෘත වන බව මහජනයා දැනුම්වත් කිරීමට
- ආයතනයේ සියලු තොරතුරු ලොව ඕනෑම තැනක සිට ගත හැකි ක්‍රමවේදයක් සැකසීම
- ආයතනය සිදු කළ විශේෂිත ව්‍යාපෘති , ඒවායෙහි සුවිශේෂී අවස්ථා සම්බන්ධව ජනතාව දැනුම්වත් කිරීම

1. අරමුදල් ලබා දීම , මාධ්‍ය සාකච්ඡා, වීඩියෝ සම්මන්ත්‍රණ, විස්තර පත්‍රිකා
2. සම්මාන පරිනැමීම, මාධ්‍ය නිවේදන, වෙබ් හා සමාජ ජාලා, පොත් පිංච
3. දිරි දීමනා ලබා දීම, මාධ්‍ය නිවේදන, මාධ්‍ය කට්ටල, පුවත් හසුන්
4. තෑගි ලබා දීම, මාධ්‍ය සාකච්ඡා, විද්‍යුත් මාධ්‍ය මධ්‍යස්ථාන, විස්තර පත්‍රිකා
5. සම්මාන ලබා දීම, ප්‍රවෘත්ති සාකච්ඡා , වීඩියෝ ප්‍රවෘත්ති, පුවත් හසුන්

35. රූගත කරමින් පවතින චිත්‍රපටයක ප්‍රධාන නළුවා එක් පසෙක සිට අනෙක් පසට වේගයෙන් ගමන් කරන ආකාරය පෙන්වන රූපරාමුවක දී යොදා ගත යුතු යැයි ඔබ යෝජනා කරන කැමරා කෝණය වන්නේ,

1. සමීප රූපරාමුවකි. ( Close Up )

2. දුර රූපයකි. ( Long Shot )

3. උඩ පහළ රූපරාමුවකි. ( Tilting )

4. කැමරාව දෙපසට ගමන් කරවන රූපරාමුවකි.( Paning)

5. අති සමීප රූප රාමුවකි. ( Extreme Close Up )

36. ශෝන් මැක්බ්‍රයිඩ්ගේ සහභාගීත්වයෙන් යුනෙස්කෝ සංවිධානය ඉදිරිපත් කළ මැක්බ්‍රයිඩ් වාර්තාව සම්බන්ධව නොගැළපෙන ප්‍රකාශය වන්නේ,

1. “Many Voices One World” නමින් එය නම් කිරීම.
2. සන්නිවේදන ප්‍රතිපත්ති සකස් විය යුත්තේ අසමානතා දුරු කිරීමට බව ප්‍රකාශ කිරීම.
3. ගෝලීය මාධ්‍ය නිරූපණය වඩාත් සාධාරණීකරණය කිරීමට ආරම්භ කිරීම.

4. සුළුතරයට ප්‍රජාතන්ත්‍රීය ව අදහස් ප්‍රකාශයට නොලැබුණහොත් වෙනත් ආකාරයට පීඩනය පුපුරා යා හැකි බව දැක්වීම.
5. ජනමාධ්‍ය ආයතන අතර තාක්ෂණික ගැටලු නියාමනයට කටයුතු කිරීම.

37. සමීක්ෂණ වාර්තාවක හැඳින්වීමේ කොටසක දී අන්තර්ගත විය යුතු කරුණු අතරට අයත් වන්නේ,

1. මාතෘකාව හා එයට පසුබිම් වූ කරුණු පිළිබඳව විග්‍රහ කිරීම.
2. අරමුණු හා වැදගත්කම පැහැදිලිව විස්තර කළ යුතුයි.
3. තෝරාගත් ගැටලුව පැහැදිලි කළ යුතුයි.
4. සමීක්ෂණයේ දී මුහුණ දුන් අත්දැකීම් හා සීමා ගැන විස්තර කළ යුතුයි.
5. දත්ත රැස් කළ විධි ක්‍රම පිළිබඳ ව විස්තර කළ යුතුයි.

38. ජනතාව හා ඔවුන්ගේ ගැටලු නම් කෘතිය තුළින් සන්නිවේදනය පිළිබඳව ආරම්භක මතවාදයන් ඉදිරිපත් කළ විද්වතෙකු වන්නේ,

1. ජෝන් ඩුවී ය.
2. චාල්ස් කුලී ය.
3. වෝල්ටර් ලිප්මාන් ය.
4. ඇරිස්ටෝටල් ය.
5. හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය.

39. නව මාධ්‍ය හා සමාජ මාධ්‍ය පරිහරණය කරන සන්නිවේදකයාට මෙන් ම ග්‍රාහකයාටත් සන්නිවේදන ක්‍රියාවලියට සහභාගී විය හැක. නව මාධ්‍ය ලක්ෂණ වලට අනුව මේ සඳහා වඩාත් ගැළපෙන්නේ,

1. සංඛ්‍යාංකකරණයයි.
2. ජාලගතකරණයයි.
3. අන්තර් ක්‍රියාකාරීත්වයයි.
4. ස්වයංකරණයයි.
5. දත්ත සංචිතකරණයයි.

40. පුද්ගලයෙකුගේ සනීපාරක්ෂක කටයුතු, වාසස්ථාන , පෝෂණය, අධ්‍යාපනය, මානව හිමිකම් වැනි සාධක ඉටු කර ගැනීම සඳහා සන්නිවේදනය යොදා ගැනීම හඳුන්වන්නේ,

1. ස්වයං නිර්ණය ලෙසයි.
2. ප්‍රජා සහභාගීත්ව වර්ධනයයි.
3. සංවර්ධන සන්නිවේදන අපේක්ෂා ලෙසයි.
4. අවශ්‍යතා කේන්ද්‍රීයත්වය ලෙසයි.
5. පරිසර විද්‍යාත්මක සමබරතාව ලෙසයි.

41. පෙර දින තිරගත වූ චිත්‍රපටයක් නැරඹීමට ගිය සංජනා පසු දින පාසලට පැමිණ සිය මිතුරියට එහි අඩංගු හරය පැහැදිලි කළාය. විචාරශීලී ග්‍රාහකත්වයට අනුව මෙම හැකියාව,

1. තක්සේරුවයි.
2. වියුක්තිකරණයයි.
3. සංස්ලේෂණයයි.
4. විශ්ලේෂණයයි.
5. කාණ්ඩකරණයයි.

42. ඔබ ලියූ ගේය පද රචනයක් ඔබගේ අවසරයකින් තොරව වෙනත් පුද්ගලයෙක් සංගීතය මුසු කොට ගායනා කරමින් ප්‍රතිලාභ ලබන බව අනාවරණය වුවහොත් ඔබට සාධාරණය ඉටුකර ගැනීමට සහාය ලබා ගත යුත්තේ,

1. 1973 අංක 05 දරණ පුවත්පත් මණ්ඩල පනතෙනි.
2. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 වගන්තියෙනි.
3. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 19 වන වගන්තියෙනි.
4. 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනතෙනි.
5. 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනතෙනි.

43. ඔබ සිදු කරන පර්යේෂණයකට ලංකාදීප පුවත්පතේ වෙබ් අඩවියට ගොස් ක්ෂණිකව පසුගිය පුවත්පත් වල ඔබට අවශ්‍ය ලිපි වල තොරතුරු ලබා ගත හැකි විය. මෙහි දක්නට හැකි නව මාධ්‍ය ලක්ෂණ වන්නේ,

1. ජාලගතකරණය, වේගවත් සංදේශකරණය හා දත්ත සංචිතකරණයයි.

2. අධිපාධනීයත්වය, වේගවත් සංදේශකරණය හා දත්ත සංචිතකරණයයි.
3. ජාලගතකරණය, අන්තර්ක්‍රියාකාරීත්වය හා අධිපාධනීයත්වයයි.
4. ස්වයංකරණය, අධිපාධනීයත්වය හා ජාලගතකරණයයි.
5. අන්තර් ක්‍රියාකාරීත්වය, ස්වයංකරණය හා වේගවත් සංදේශකරණයයි.

44. මාධ්‍ය නියෝජිතයන්ගේ ද මැදිහත්වීමක් සහිතව නීතිය මඟින් ස්ථාපිත නියාමන ක්‍රමවේදය වන්නේ,

1. ස්වයං නියාමනය යි. 2. මාධ්‍ය නියාමනය යි. 3. සහ නියාමනය යි.

4. අභ්‍යන්තරික නියාමනය යි. 5. ව්‍යවස්ථාපිත නියාමනය යි.

45. පෙර පාසලේ සිට විශ්ව විද්‍යාල මට්ටම දක්වාත් වැඩිහිටි අධ්‍යාපනය තුළත් මාධ්‍ය අධ්‍යාපන වැඩසටහන් ආරම්භ කළ යුතු බව සඳහන් ප්‍රකාශය වන්නේ,

1. ජිනීවා ප්‍රකාශනයයි. 2. පැරිස් ප්‍රකාශනයයි. 3. මැක්බ්‍රයිඩ් වාර්තාවයි.

4. දිල්ලි ප්‍රකාශනයයි. 5. ගෲන්වල්ඩ් ප්‍රකාශනයයි.

46. ලියනාඩෝ ඩාවින්චි විසින් ඉදිරිපත් කරන ලද නිර්මාණශීලීත්වයේ මූලිකාංග පමණක් දැක්වෙන වරණය කුමක් ද?
1. කුතුහලය, සතතාභ්‍යාසය, සම්බන්ධතා
2. සධුගමනය, සංජානනය, සංවේදනය
3. සම්බන්ධතා, සංවේදනය, සධුගමනය
4. සුවිදර්ශය, සංජානනය, කුතුහලය
5. සංවේදනය, සතතාභ්‍යාසය, ප්‍රස්තුත ගවේෂණය

47. සමීක්ෂණයක දී ආරම්භයේ සිටම ගතික නොවී ස්ථාවර බවක් පෙන්නුම් කරනුයේ මේ අතරින් කවරක් ද?

1. දත්ත වල ප්‍රමාණය 2. පර්යේෂණ ගැටලුව 3. ග්‍රන්ථ විමර්ශනය
4. දත්ත ඉදිරිපත් කරන ආකාරය 5. නිගමනය

48. ශ්‍රී ලාංකීය මාධ්‍ය ක්ෂේත්‍රයේ අන්තර්ගතය තුළ දක්නට ලැබෙන ප්‍රවනතා අතරට අයත් නොවන්නේ,

1. සරල භාෂා භාවිතය වැඩි වීම. 2. වෙළෙඳ දැන්වීම් ප්‍රමාණාත්මක ව ඉහළ යාම.

3. ඉදිරිපත් කිරීමේ නව මාදිලි යොදා ගැනීම. 4. ග්‍රාහක අවශ්‍යතා ගැන සැලකිලිමත් වීම.

5. විනෝදාස්වාදය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම.

49. පහත කරුණු අතරින් සිද්ධි කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම් අතරට පමණක් අයත් වරණය වන්නේ,
A- ආයතනික හොඳ හිත හා ප්‍රතිරූපය ප්‍රවර්ධනය
B- කාල කළමනාකරණය
C- මූල්‍ය කළමනාකරණය
D- අර්බුධකාරී තත්ත්ව කළමනාකරණය
E- පුහුණුවීම් හා වෘත්තීය සංවර්ධනය

1. A,B,C,D පමණි. 2. B,C,D,E පමණි. 3. A,C,D,E පමණි.

4. A,B,D,E පමණි. 5. A,B,C,D,E යන සියල්ලම අයත් වේ.

50. එක්තරා ග්‍රාමීය පාසලක ගුරු මණ්ඩලය ඔවුනොවුන් අතර සහයෝගීතාවය පවත්වා ගනිමින් කණ්ඩායම් හැඟීමෙන් යුතු ව වෙහෙස නොබලා කටයුතු කිරීමෙන් එම පාසලේ විභාග ප්‍රතිඵල වාර්තාගත ලෙස ඉහළ දැමීමට සමත් වූහ. ඔවුන්ගේ සාර්ථකත්වය පිටුපස ඇත්තේ ,

1. වගකීමෙන් වැඩ කිරීමයි. 2. වගවීමෙන් වැඩ කිරීමයි.

3. යුතුකම් ඉටුකිරීමයි. 4. කණ්ඩායම් හැඟීමයි.

5. සහානුභූතික වීමයි.

PAST PAPERS WIKI

Past Papers Wiki

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2026
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2026

| 13 ශ්‍රේණිය | 29 | S | II | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II<br>Communication & Media studies | කාලය : පැය තුනයි<br>Time : Three hours |
|---|---|---|---|---|---|

අමතර කියවීම් කාලය : මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**උපදෙස් :**

- **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව 40කි.**

---

1.

1. සන්නිවේදනය පිළිබඳ හැරල්ඩ් ලැස්වෙල්ගේ නිර්වචනය ලියන්න. (ලකුණු 04)
2. අන්තර් පුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජන **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 08)
3. වාචික සන්නිවේදන කුසලතා **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 12)
4. ගෝලීය සංස්කෘතිය තුළ දක්නට ලැබෙන ලක්ෂණ **හතරක්** විස්තර කරන්න. (ලකුණු 16)

2 . රටක සංවර්ධනය සඳහා මාධ්‍යයේ කාර්ය භාරය ඉතා වැදගත් බව විද්වත් දේශනයක දී ප්‍රකාශ විය.

1. මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය වල ලක්ෂණ **දෙක** බැගින් නම් කරන්න. (ලකුණු 04)
2. එක්සත් ජාතීන්ගේ සංවිධානය දක්වා ඇති සංවර්ධනය සඳහා සන්නිවේදන ප්‍රවේශ **දෙකක්** කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 08)
3. ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය අන්තර්ගතයෙහි දක්නට ලැබෙන පහත සඳහන් නව ප්‍රවණතා රටේ සංවර්ධනය කෙරෙහි බලපාන ආකාරය නිදසුන් සහිතව විස්තර කරන්න.
   (අ) සරල භාෂා භාවිතය
   (ආ) විනෝදාස්වාදය පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම (ලකුණු 12)
4. මාධ්‍ය මගින් සංස්කෘතිය වෙත ඇති කරනු ලබන බලපෑම කරුණු **හතරක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 16)

3. නිර්මාණකරණය ඵලදායී සන්නිවේදනයට මග පාදයි.

1. නිර්මාණකරණයේදී නිර්මාණකරුවකුට අත්දැකීම් ලැබෙන ආකාර **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)
2. ගුවන් විදුලියේ නිර්මාණාත්මක භාෂා භාවිතයේදී සැලකිලිමත් විය යුතු කරුණු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)
3. ෆැනත් වීවර් ආකෘතියේ සුවිශේෂ ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)
4. නිර්මාණාත්මක සන්නිවේදනයේදී ජනශ්‍රැතිකාංග හා ජන කලා යොදා ගැනීමේ වැදගත්කම කරුණු **හතරක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 16)

4. රූපවාහිනී නාලිකාවක ජනප්‍රිය වැඩසටහන් එම නාලිකාව විසින් ම පවත්වාගෙන යනු ලබන යූ ටියුබ් නාලිකාවක් මගින් ද සජීව ලෙස විකාශනය කරන ලදී.

1. ඉහත සඳහන් මාධ්‍ය භාවිතයට අදාල මාධ්‍ය ප්‍රවණතාව නම් කරන්න. (ලකුණු 04)
2. මාධ්‍ය මහජන සම්බන්ධතාවයේදී යොදා ගත හැකි විධික්‍රම **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)
3. මාධ්‍ය ප්‍රතිපත්ති වල අන්තර්ගත විය යුතු පහත කරුණු විස්තර කරන්න.
   (අ) මාධ්‍ය කර්මාන්තයේ හිමිකාරීත්වය
   (ආ) තාක්ෂණික යටිතල පහසුකම් හා තාක්ෂණික සංවර්ධනය
   (ඉ) මාධ්‍ය අධිකාරීන් හා වෙළඳපොළ නියාමනය (ලකුණු 12)
4. සිද්ධි කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම කරුණු **හතරක්** ඔස්සේ විස්තර කරන්න. (ලකුණු 16)

5. සිදුවීම් වාර්තාකරණයේ දී විවිධ පාර්ශව එම සිදුවීම් විවිධාකාරයෙන් අර්ථකථනය කරමින් වාර්තා කිරීම සමාජ මාධ්‍ය භාවිතයේ දක්නට ලැබෙන ලක්ෂණයකි.

1. නව මාධ්‍ය හා සමාජ මාධ්‍යයේ ලක්ෂණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)
2. සමාජ මාධ්‍ය භාවිතයේදී ග්‍රාහක සහභාගීත්වය සිදුකරනු ලබන ආකාර **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 08)
3. සමාජ මාධ්‍ය නියාමනයේ අවශ්‍යතාව පිළිබඳ කරුණු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)
4. පුවත්පත් මාධ්‍ය අන්තර්ගතය ප්‍රවෘත්ති හා විශේෂාංග යනුවෙන් කොටස් දෙකකි. පුවත්පත් විශේෂාංග වර්ග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 16)

6. මාධ්‍ය ක්‍රියාවලිය නියාමනයට ලක්වීමේ අවශ්‍යතාව පිළිබඳ සමාජය තුළ සංවාදයට බඳුන් වෙයි.

1. ජනමාධ්‍යයේ ප්‍රයෝජන **හතරක්** නම් කරන්න. (ලකුණු 04)
2. මාධ්‍ය නියාමනය සඳහා යොද ගන්නා මූලික ප්‍රවේශ **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)
3. වර්තමාන ජනමාධ්‍ය ප්‍රවණතාවක් වන ජනමාධ්‍ය වාණිජකරණයට ලක් වීමේ ප්‍රතිඵල **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)
4. ජනමාධ්‍ය ප්‍රතිපෝෂණය ලබා ගැනීම සඳහා සමීක්ෂණය යොදා ගැනීමේ ප්‍රයෝජන **හතරක්** විස්තර කරන්න. (ලකුණු 16)

7. මාධ්‍ය මගින් සමාජ වෙත ඇති කෙරෙන බලපෑම පිළිබඳ නොයෙක් පර්යේෂණ මගින් අනාවරණය වී ඇත.

1. රූපවාහිනී නැරඹීම ළමා මනසට බලපාන ආකාරය පිළිබඳ පර්යේෂණ මගින් අනාවරණය කරගෙන ඇති කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 04)
2. ජනමාධ්‍යයේ කාර්ය භාරයන් **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)
3. මාධ්‍ය විචාරයේ දී අවධානයට යොමු වන පහත කරුණු විස්තර කරන්න.
   (අ) මාධ්‍ය හා දෛනික ජීවිතය
   (ආ) ස්ත්‍රීවාදී විචාරය
   (ඉ) මාධ්‍ය හා මායාව (ලකුණු 12)
4. සමාජ මාධ්‍ය මගින් සමාජයට සිදුවන අයහපත් බලපෑම අවම කිරීම සඳහා අනුගමනය කළ යුතු ආචාර ධර්ම **හතරක්** ඔබගේ යෝජනා ලෙස විස්තර කරන්න. (ලකුණු 16)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2026
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2026

13 ශ්‍රේණිය | 29 S I

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I
Communication & Media

කාලය : පැය දෙකයි
Time : Two hours

# පිළිතුරු පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 3 | 11 | 2 | 21 | 2 | 31 | 1 | 41 | 2 |
| 2 | 1 | 12 | 2 | 22 | 5 | 32 | 1 | 42 | 4 |
| 3 | 2 | 13 | 2 | 23 | 2 | 33 | 3 | 43 | 1 |
| 4 | 1 | 14 | 5 | 24 | 2 | 34 | 2 | 44 | 3 |
| 5 | 3 | 15 | 2 | 25 | 1 | 35 | 4 | 45 | 5 |
| 6 | 4 | 16 | 5 | 26 | 5 | 36 | 5 | 46 | 3 |
| 7 | 2 | 17 | 1 | 27 | 3 | 37 | 5 | 47 | 2 |
| 8 | 3 | 18 | 4 | 28 | 4 | 38 | 1 | 48 | 4 |
| 9 | 5 | 19 | 3 | 29 | 2 | 39 | 3 | 49 | 1 |
| 10 | 4 | 20 | 3 | 30 | 5 | 40 | 4 | 50 | 2 |

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2026
**General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2026**

| | | | | | |
|---|---|---|---|---|---|
| 13 ශ්‍රේණිය | 29 | S | II | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II<br>Communication & Media studies | කාලය : පැය තුනයි<br>Time : Three hours |

අමතර කියවීම් කාලය : මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**උපෙදස් :**

❖ **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව 40කි.**

---

1.

1. සන්නිවේදනය පිළිබඳ හැරල්ඩ් ලැස්වෙල්ගේ නිර්වචනය ලියන්න. (ලකුණු 04)
2. අන්තර් පුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජන **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 08)
3. වාචික සන්නිවේදන කුසලතා **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 12)
4. ගෝලීය සංස්කෘතිය තුළ දක්නට ලැබෙන ලක්ෂණ **හතරක්** විස්තර කරන්න. (ලකුණු 16)

2 . රටක සංවර්ධනය සඳහා මාධ්‍යයේ කාර්ය භාරය ඉතා වැදගත් බව විද්වත් දේශනයක දී ප්‍රකාශ විය.

1. මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය වල ලක්ෂණ **දෙක** බැගින් නම් කරන්න. (ලකුණු 04)
2. එක්සත් ජාතීන්ගේ සංවිධානය දක්වා ඇති සංවර්ධනය සඳහා සන්නිවේදන ප්‍රවේශ **දෙකක්** කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 08)
3. ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය අන්තර්ගතයෙහි දක්නට ලැබෙන පහත සඳහන් නව ප්‍රවණතා රටේ සංවර්ධනය කෙරෙහි බලපාන ආකාරය නිදසුන් සහිතව විස්තර කරන්න.
   (අ) සරල භාෂා භාවිතය
   (ආ) විනෝදාස්වාදය පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම (ලකුණු 12)

4. මාධ්‍ය මගින් සංස්කෘතිය වෙත ඇති කරනු ලබන බලපෑම කරුණු **හතරක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 16)

3. නිර්මාණකරණය ඵලදායී සන්නිවේදනයට මග පාදයි.

1. නිර්මාණකරණයේදී නිර්මාණකරුවකුට අත්දැකීම් ලැබෙන ආකාර **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)
2. ගුවන් විදුලියේ නිර්මාණාත්මක භාෂා භාවිතයේදී සැලකිලිමත් විය යුතු කරුණු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)
3. ෂැනන් වීවර් ආකෘතියේ සුවිශේෂ ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)
4. නිර්මාණාත්මක සන්නිවේදනයේදි ජනශ්‍රැතිකාංග හා ජන කලා යොදා ගැනීමේ වැදගත්කම කරුණු **හතරක්** ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 16)

4. රූපවාහිනී නාලිකාවක ජනප්‍රිය වැඩසටහන් එම නාලිකාව විසින් ම පවත්වාගෙන යනු ලබන යූ ටියුබ් නාලිකාවක් මගින් ද සජීව ලෙස විකාශනය කරන ලදී.

1. ඉහත සඳහන් මාධ්‍ය භාවිතයට අදාල මාධ්‍ය ප්‍රවණතාව නම් කරන්න. (ලකුණු 04)
2. මාධ්‍ය මහජන සම්බන්ධතාවයේදී යොදා ගත හැකි විධික්‍රම **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)
3. මාධ්‍ය ප්‍රතිපත්ති වල අන්තර්ගත විය යුතු පහත කරුණු විස්තර කරන්න.
   (අ) මාධ්‍ය කර්මාන්තයේ හිමිකාරීත්වය
   (ආ) තාක්ෂණික යටිතල පහසුකම් හා තාක්ෂණික සංවර්ධනය
   (ඉ) මාධ්‍ය අධිකාරීන් හා වෙළඳපොළ නියාමනය (ලකුණු 12)
4. සිද්ධි කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම කරුණු **හතරක්** ඔස්සේ විස්තර කරන්න. (ලකුණු 16)

5. සිදුවීම් වාර්තාකරණයේ දී විවිධ පාර්ශව එම සිදුවීම් විවිධාකාරයෙන් අර්ථකථනය කරමින් වාර්තා කිරීම සමාජ මාධ්‍ය භාවිතයේ දක්නට ලැබෙන ලක්ෂණයකි.

1. නව මාධ්‍ය හා සමාජ මාධ්‍යයේ ලක්ෂණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)
2. සමාජ මාධ්‍ය භාවිතයේදී ග්‍රාහක සහභාගීත්වය සිදුකරනු ලබන ආකාර **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 08)
3. සමාජ මාධ්‍ය නියාමනයේ අවශ්‍යතාව පිළිබඳ කරුණු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)
4. පුවත්පත් මාධ්‍ය අන්තර්ගතය ප්‍රවෘත්ති හා විශේෂාංග යනුවෙන් කොටස් දෙකකි. පුවත්පත් විශේෂාංග වර්ග **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 16)

6. මාධ්‍ය ක්‍රියාවලිය නියාමනයට ලක්වීමේ අවශ්‍යතාව පිළිබඳ සමාජය තුළ සංවාදයට බඳුන් වෙයි.

1. ජනමාධ්‍යයේ ප්‍රයෝජන **හතරක්** නම් කරන්න. (ලකුණු 04)
2. මාධ්‍ය නියාමනය සඳහා යොද ගන්නා මූලික ප්‍රවේශ **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)
3. වර්තමාන ජනමාධ්‍ය ප්‍රවණතාවක් වන ජනමාධ්‍ය වාණිජකරණයට ලක් වීමේ ප්‍රතිඵල **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)
4. ජනමාධ්‍ය ප්‍රතිපෝෂණය ලබා ගැනීම සඳහා සමීක්ෂණය යොදා ගැනීමේ ප්‍රයෝජන **හතරක්** විස්තර කරන්න. (ලකුණු 16)

7. මාධ්‍ය මගින් සමාජ වෙත ඇති කෙරෙන බලපෑම පිළිබඳ නොයෙක් පර්යේෂණ මගින් අනාවරණය වී ඇත.

1. රූපවාහිනී නැරඹීම ළමා මනසට බලපාන ආකාරය පිළිබඳ පර්යේෂණ මගින් අනාවරණය කරගෙන ඇති කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 04)
2. ජනමාධ්‍යයේ කාර්ය භාරයන් **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)
3. මාධ්‍ය විචාරයේ දී අවධානයට යොමු වන පහත කරුණු විස්තර කරන්න.
   (අ) මාධ්‍ය හා දෛනික ජීවිතය
   (ආ) ස්ත්‍රීවාදී විචාරය
   (ඉ) මාධ්‍ය හා මායාව (ලකුණු 12)
4. සමාජ මාධ්‍ය මගින් සමාජයට සිදුවන අයහපත් බලපෑම අවම කිරීම සඳහා අනුගමනය කළ යුතු ආචාර ධර්ම **හතරක්** ඔබගේ යෝජනා ලෙස විස්තර කරන්න. (ලකුණු 16)

උව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2026
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2026

| 13 ශ්‍රේණිය | 29 S II | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II Communication & Media studies | කාලය : පැය තුනයි Time : Three hours |
|---|---|---|---|

**පිළිතුරු පත්‍රය**

1.

1. සන්නිවේදනය පිළිබඳ හැරල්ඩ් ලැස්වෙල්ගේ නිර්වචනය ලියන්න.

   යම් කිසිවෙක්, යම් කිසිවක්, කිසියම් නාලිකාවකින්, යම් කිසිවෙකුට කිසියම් බලපෑමක් කිරීම සඳහා ප්‍රකාශ කරනු ලබන දෙය සන්නිවේදනයයි.

   ලකුණු 4

2. අන්තර් පුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජන දෙකක් විස්තර කරන්න.
   - වඩාත් පහසුවෙන් අන්තර් ක්‍රියාකාරී සන්නිවේදනයක යෙදීමට ඇති හැකියාව
   - අනෙකුත් සන්නිවේදන වර්ගයන්ට සාපේක්ෂව ග්‍රාහකයා පෙළඹවීමේ හැකියාව වැඩි වීම
   - අන්තර් සම්බන්ධතා වර්ධනය කර ගැනීමට හැකි වීම
   - පහසුවෙන් අන්‍යෝන්‍ය අවබෝධය හා විශ්වාසය තහවුරු කර ගත හැකි වීම
   - වඩා තීව්‍ර සහවේදනයකට අවකාශ සැලසීම
   - බාධක අවම වීම ලකුණු 4x2 = 8

3. වාචික සන්නිවේදන කුසලතා තුනක් පැහැදිලි කරන්න.
   - වාග් කෝෂය පුළුල් කර ගැනීම
   - තමා සතු අදහස් හා තොරතුරු ඇතුළත් දැනුම වර්ධනය කර ගැනීම
   - පෙර සූදානම
   - ඉදිරිපත් කිරීමේ කුසලතා වැඩි දියුණු කර ගැනීම
   - යෝග්‍ය භාෂාවක් භාවිතය
   - නිර්වාචික සන්නිවේදනය ඵලදායී ලෙස භාවිතය
   - පැහැදිලිව වචන උච්ඡාරණය කිරීම හා තේරුම්ගත හැකි වේගයකින් කතා කිරීම
   - වගකීමෙන් යුතුව වචන භාවිතය
   - පෞද්ගලික අනන්‍යතාවක් හා ස්වීයත්වයක් ගොඩනගා ගැනීම ලකුණු 4x3 = 12

4. ගෝලීය සංස්කෘතිය තුළ දක්නට ලැබෙන ලක්ෂණ හතරක් විස්තර කරන්න.
   - ගෝලීය විඥාපන මාධ්‍ය මත ව්‍යාප්ත වීම
   - දේශීය/ ජාතික සංස්කෘතික අනන්‍යතා නිශේධනය වීම

- බටහිර සංස්කෘතියේ ව්‍යාප්තිය
- බටහිර මතවාදී යාන්ත්‍රණයේ කොටසක් ලෙස ක්‍රියාත්මක වීම
- සංස්කෘතික අධිරාජ්‍යවාදයක් ක්‍රියාත්මක වීම ලකුණු 4x4 = 16

2 . රටක සංවර්ධනය සඳහා මාධ්‍යයේ කාර්ය භාරය ඉතා වැදගත් බව විද්වත් දේශනයක දී ප්‍රකාශ විය.

1. මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය වල ලක්ෂණ දෙක බැගින් නම් කරන්න.

මුද්‍රිත මාධ්‍ය

- සාක්ෂරතාව මත පදනම් වීම
- පෙළ සහ රූපය සංයෝගීව අදහස් ප්‍රකාශ කිරීම
- කල් තබා ගෙන පරිහරණය කළ හැකි වීම
- විස්තරාත්මකබවකින් යුත්ක වීම
- විද්‍යුත් මාධ්‍යයට සාපේක්ෂව වේගවත් නොවීම

විද්‍යුත් මාධ්‍ය

- වේගවත් බව
- ශ්‍රව්‍ය හා ශ්‍රව්‍ය දෘශ්‍ය සන්දේශ දක්නට ලැබීම
- සංක්ෂිප්ත බව
- සන්දේශ එක් වරක් පමණක් පරිහරණය කළ හැකි වීම ලකුණු 1x 4 =4

2. එක්සත් ජාතීන්ගේ සංවිධානය දක්වා ඇති අන්තර් සම්බන්ධිත සංවර්ධනය සඳහා සන්නිවේදන ප්‍රවේශ දෙකක් කෙටියෙන් හඳුන්වන්න.
   - හැසිරීම් වෙනස්කම් සඳහා සන්නිවේදනය (Communication for behaviour change)
   - සමාජීය වෙනස්කම් සඳහා සන්නිවේදනය (Communication for social change)
   - නියාමනය සඳහා සන්නිවේදනය (Communication for regulation)
   - පාරිසරික සමතුලිතතාව සඳහා සන්නිවේදන (Communication for ecological balance)

ලකුණු 4x2 = 8

3. ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය අන්තර්ගතයෙහි දක්නට ලැබෙන පහත සඳහන් නව ප්‍රවණතා රටේ සංවර්ධනය කෙරෙහි බලපාන ආකාරය නිදසුන් සහිතව විස්තර කරන්න.

(අ) සරල භාෂා භාවිතය

- අනවශ්‍ය ලෙස සරල වීම නිසා සංවර්ධන පණිවිඩ වල වටිනාකම අඩු වීම
- බොහෝ දෙනෙකුට ග්‍රහණය කර ගත හැකි වන අයුරින් සංවර්ධන සන්දේශ ඉදිරිපත් කළ හැකි වීම

(ආ) විනෝදාස්වාදය පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම

- සංවර්ධන පණිවිඩ වලට අඩු ඉඩක් ලබා දීම
- මාධ්‍ය විනෝදාස්වාදය සඳහා පමණක් භාවිත කිරීම

ආදී උචිත කරුණු විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

| | | |
|---|---|---|
| ලකුණු | කරුණු දෙකක් විස්තර කිරීම | 4x2 = 8 |
| | නිදසුන් | 2x2 = 4 |
| | එකතුව | 12 |

4. මාධ්‍ය මගින් සංස්කෘතිය වෙත ඇති කරනු ලබන බලපෑම කරුණු හතරක් ඇසුරින් පැහැදිලි කරන්න.
   - සංස්කෘතිය පවරා දීම
   - සංස්කෘතිය සංරක්ෂණය කිරීම
   - සංස්කෘතිය හුවමාරුව
   - වටිනා සංස්කෘතිකාංග හඳුන්වා දීම
   - ආකල්ප වෙනස් කිරීම
   - චර්යා වෙනස් කිරීම
   - පවතින සංස්කෘතිය අභියෝගයට ලක් කිරීම
   - ගෝලීය සංස්කෘතිය ව්‍යාප්තිය කිරීම ලකුණු 4x4 = 16

3. නිර්මාණකරණය ඵලදායී සන්නිවේදනයට මග පාදයි.

1. නිර්මාණකරණයේදී නිර්මාණකරුවකුට අත්දැකීම් ලැබෙන ආකාර දෙකක් නම් කරන්න.
   - පෞද්ගලික අත්දැකීම්
   - වෙනත් අයගේ අත්දැකීම
   - මාධ්‍ය මගින් ලබන අත්දැකීම ලකුණු 2x2= 4

2. ගුවන් විදුලියේ නිර්මාණාත්මක භාෂා භාවිතයේදී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් කෙටියෙන් විස්තර කරන්න.
   - කෙටි වාක්‍ය භාවිතය
   - සරල භාෂා භාවිතය
   - ශ්‍රාවක පරිකල්පනය පුළුල් කරන භාෂා ශෛලියක් යොදා ගැනීම
   - ශ්‍රැති ගෝචර භාෂාවක් භාවිත කිරීම
   - ඉලක්ක ගත ග්‍රාහක කණ්ඩායමට උචිත පරිදී භාෂා භාවිතය
   - වැඩසටහන් අකෘතියට උචිත භාෂා භාවිතය ලකුණු 4x2 = 8

3. ෂැනන් වීවර් ආකෘතියේ සුවිශේෂ ලක්ෂණ තුනක් විස්තර කරන්න.
   - රේඛීය ආකෘතියක් වීම
   - සන්නිවේදන බාධක පිළිබඳ පළමුවරට විග්‍රහ කිරීම
   - තාක්ෂණික කෝණයකින් සන්නිවේදනය විග්‍රහ කිරීම
   - පණිවිඩ සම්ප්‍රේෂණය හා ප්‍රතිග්‍රහණ ක්‍රියාවලීන් විග්‍රහ කිරීම ලකුණු 4x3 =12

4. නිර්මාණාත්මක සන්නිවේදනයේදි ජනශ්‍රැතිකාංග හා ජන කලා යොදා ගැනීමේ වැදගත්කම කරුණු හතරක් ඇසුරින් විස්තර කරන්න.
   - ජන විඥානයට සමීප වීම
   - ජනයාට හුරු පුරුදු සංඥා, සංකේත වලින් යුත්ක වීම
   - විශ්වසනීයත්වයකින් යුත්ක වීම
   - නිර්මාණාත්මක මූලාශ්‍ර බහුල විම
   - ආකාර්ශනීය ගුණයෙන් යුක්ත විම ලකුණු 4x4=16

4. රූපවාහිනී නාලිකාවක ජනප්‍රිය වැඩසටහන් එම නාලිකාව විසින් ම පවත්වාගෙන යනු ලබන යූ ටියුබ් නාලිකාවක් මගින් ද සජීව ලෙස විකාශනය කරන ලදී.

1. ඉහත සඳහන් මාධ්‍ය භාවිතයට අදාල මාධ්‍ය ප්‍රවණතාව නම් කරන්න.
   - මාධ්‍ය අභිසාරීතාව ලකුණු 4

2. මාධ්‍ය මහජන සම්බන්ධතාවයේදී යොදා ගත හැකි විධික්‍රම දෙකක් කෙටියෙන් විස්තර කරන්න.
   - ප්‍රවෘත්ති සාකච්ඡා
   - ප්‍රවෘත්ති නිවේදන
   - ඡායාරූප
   - මාධ්‍ය කට්ටල
   - මාධ්‍යවේදීන් සඳහා වැඩමුළු පැවැත්වීම
   - ත්‍යාග, සුබ පැතුම්පත්, සුහද හමු ලකුණු 4x2 = 8

3. මාධ්‍ය ප්‍රතිපත්ති වල අන්තර්ගත විය යුතු පහත කරුණු විස්තර කරන්න.

   (අ) මාධ්‍ය කර්මාන්තයේ හිමිකාරීත්වය
   - මාධ්‍ය කර්මාන්තය රාජ්‍ය හෝ පෞද්ගලික අංශයට හිමි විය යුතු ද යන්න පිළිබඳ ප්‍රතිපත්ති

   (ආ) තාක්ෂණික යටිතල පහසුකම් හා තාක්ෂණික සංවර්ධනය
   - තාක්ෂණික සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති සකස් කර තිබීම
   - විද්‍යුත් මාධ්‍ය සංඛ්‍යාත බෙදා දීම පිළිබඳ ප්‍රතිපත්ති තිබීම
   - විද්‍යුත් විකාශනය සංඛ්‍යාංකකරණය පිළිබඳ ප්‍රතිපත්ති තිබීම

   (ඉ) මාධ්‍ය අධිකාරීන් හා වෙළඳපොළ නියාමනය
   - මාධ්‍ය නියාමනය කරන අධිකාරී ආයතන පිළිබඳ ප්‍රතිපත්ති තිබීම
   - තරගකාරී මාධ්‍ය වෙළඳපොල නියාමනය පිළිබඳ ප්‍රතිපත්ති තිබීම

   මේ ආදී කරුණු විස්තර කර තිබිය යුතුය

   ලකුණු 4x3 = 12

4. සිද්ධි කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත්කම කරුණු හතරක් ඔස්සේ විස්තර කරන්න.
   - ආයතනික කීර්තිනාමය වර්ධනය
   - ආයතනික හොඳ හිත හා ප්‍රතිරූපය ප්‍රවර්ධනය
   - කාල කළමනාකරණය
   - මූල්‍ය කළමනාකරණය
   - අර්බුදකාරී තත්ත්ව කළමනාකරණය
   - මාධ්‍ය මගින් ප්‍රචාරණය කිරීම
   - පාර්ශවකරුවන් දිනා ගැනීම සහ රඳවා තබා ගැනීම ලකුණු 4x4=16

5. සිදුවීම් වාර්තාකරණයේ දී විවිධ පාර්ශව එම සිදුවීම් විවිධාකාරයෙන් අර්ථකථනය කරමින් වාර්තා කිරීම සමාජ මාධ්‍ය භාවිතයේ දක්නට ලැබෙන ලක්ෂණයකි.

1. නව මාධ්‍ය හා සමාජ මාධ්‍යයේ ලක්ෂණ දෙකක් නම් කරන්න.
   - අංකිතකරණය
   - ජාලගතකරණය
   - අන්තර්ක්‍රියාකාරීත්වය
   - අධිපාඨනීයත්වය
   - ස්වයංකරණය
   - දත්ත සංචිතකරණය
   - වේගවත් සන්දේශකරණය

   ලකුණු 1x4 =4

2. සමාජ මාධ්‍ය භාවිතයේදී ග්‍රාහක සහභාගීත්වය සිදුකරනු ලබන ආකාර දෙකක් විස්තර කරන්න.
   - ප්‍රතිචාර දැක්වීම (comment, like)
   - හුවමාරු කිරීම (share)
   - ප්‍රතිනිර්මාණය - මුල් නිර්මාණය ඇසුරෙන් වෙනත් නිර්මාණ සිදු කිරීම

   ලකුණු 4x2=8

3. සමාජ මාධ්‍ය නියාමනයේ අවශ්‍යතාව පිළිබඳ කරුණු තුනක් විස්තර කරන්න.
   - තොරතුරු සමාජයක පවත්නා විවිධ සන්නිවේදන විධික්‍රම කළමනාකරණය කිරීමට
   - මහජන සාමය ආරක්ෂා කිරීමට නියාමනය අවශ්‍ය වේ.
   - පොදු මහජන සන්නිවේදන ක්‍රම මගින් පුද්ගල අයිතිවාසිකම් වලට සිදු වන බලපෑම පාලනය කිරීමට
   - සන්නිවේදන ක්‍රමවේදවල සංවර්ධනයට සහ ඵලදායී භාවිතයට
   - ප්‍රකාශනය ඇතුළු තොරතුරු ලබා ගැනීමට ඇති නිදහස ප්‍රවර්ධනය කිරීමට
   - මාධ්‍ය නිදහස් වෙළෙඳ පොළ නියාමනයට

   ලකුණු 4x3= 12

4. පුවත්පත් මාධ්‍ය අන්තර්ගතය ප්‍රවෘත්ති හා විශේෂාංග යනුවෙන් කොටස් දෙකකි. පුවත්පත් විශේෂාංග වර්ග දෙකක් විස්තර කරන්න.
   - විශේෂාංග ලිපි
   - තීරු ලිපි
   - කතු වැකි
   - කෙටිකතා
   - චිත්‍ර කතා
   - සංවාද
   - පාඨක අදහස්
   - ඡායාරූප
   - චිත්‍රපට වාර්තා

   ලකුණු 8x2 = 16

6. මාධ්‍ය ක්‍රියාවලිය නියාමනයට ලක්වීමේ අවශ්‍යතාව පිළිබඳ සමාජය තුළ සංවාදයට බඳුන් වෙයි.

1. ජනමාධ්‍යයේ ප්‍රයෝජන හතරක් නම් කරන්න.
   - ප්‍රජානනය / දැනුම ලබා ගැනීම
   - අපසරණය/ විකල්ප වෙත යොමු කිරීම

- සමාජ උපයෝගීතාව
- නිෂ්කර්ශනය/ ආපසු ගැනීම ලකුණු 1x4= 4

2. මාධ්‍ය නියාමනය සඳහා යොද ගන්නා මූලික ප්‍රවේශ දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.
   - ස්වයං නියාමනය
   - සහ නියාමනය
   - ව්‍යවස්ථාපිත නියාමනය
   - අභ්‍යන්තරික නියාමනය ලකුණු 4x2= 8

3. වර්තමාන ජනමාධ්‍ය ප්‍රවණතාවක් වන ජනමාධ්‍ය වාණිජකරණයට ලක් වීමේ ප්‍රතිඵල තුනක් විස්තර කරන්න.
   - මාධ්‍ය ලාභය පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම
   - මාධ්‍ය ආචාරධර්ම හා සදාචාරය නොසලකා හැරීම
   - ග්‍රාහකයා පාරිභෝගිකයෙකු ලෙස සැලකීම
   - මාධ්‍ය නිදහස් වෙළඳපොල තුළ තරගකාරිත්වයක් ඇති වීම
   - සන්දේශ වල ගුණාත්මක හා කලාත්මක භාවයෙන් අඩු වීම ලකුණු 4x3 =12

4. ජනමාධ්‍ය ප්‍රතිපෝෂණය ලබා ගැනීම සඳහා සමීක්ෂණය යොදා ගැනීමේ ප්‍රයෝජන හතරක් විස්තර කරන්න.
   - වියදම් අඩු වීම
   - දූරස්ථව මෙහෙයවීමේ හැකියාව
   - දත්ත දායකයන් විශාල ප්‍රමාණයකින් වුව ද තොරතුරු රැස් කර ගැනීමේ හැකියාව
   - මෘදුකාංග භාවිතයෙන් තොර ව මෙන් ම මෘදුකාංග භාවිත කරමින් ද සමීක්‍ෂණ දත්ත රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම සිදු කළ හැකි ය.
   - ආකල්ප, මතවාද, විශ්වාස, චර්යා රටා, සිදුවීම් හා වටිනාකම් යනාදිය පිළිබඳ පුළුල් පරාසයක පවත්නා තොරතුරු එක් වර රැස් කර ගැනීමේ හැකියාව
   - නිවැරදි ප්‍රමිතියට අනුව සමීක්ෂණය සිදු කිරීමෙන් දෝෂ අවම කර ගත හැක
     (ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය අනුව බලන්න)

   ලකුණු 4x4 = 16

7. මාධ්‍ය මගින් සමාජ වෙත ඇති කෙරෙන බලපෑම පිළිබඳ නොයෙක් පර්යේෂණ මගින් අනාවරණය වි ඇත.

   1. රූපවාහිනී නැරඹීම ළමා මනසට බලපාන ආකාරය පිළිබඳ පර්යේෂණ මගින් අනාවරණය කරගෙන ඇති කරුණු දෙකක් ලියන්න.
      - ළමයින්ගේ සමාජ සම්බන්ධතා දුරස් වීම
      - දෙමව්පියන් සමඟ අඬදබර කරගන්නා දරුවන් තම නොරිස්සුම් සහගත හැඟීම්වලින් පලා යාමටල සිත් වේදනාවන් අමතක කර ගැනීමට රූපවාහිනිය නැරඹීමට යොමු වන බව
      - වේදනාත්මක දේ පිළිබඳ සංවේදිතාව අඩු වීම.
      - දරුවන් ඔවුන් ජීවත්වන පරිසරය හා අවට ලෝකය පිළිබඳ බියක් ඇති කර ගැනීම
      - අන් අය සමඟ කටයුතු කිරීමේ දී ආක්‍රමණශීලී වන්නටත් ඉක්මනින් ආරවුල් ඇති කරගන්නටත් දරුවන් තුළ නැඹුරුව වැඩි වීම.

      ලකුණු 2x2= 4

   2. ජනමාධ්‍යයේ කාර්ය භාර්යයන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න.
      - යුනෙස්කෝ සංවිධානය

- විලබර් ශ්‍රාම්
- හැරල්ඩ් ලැවෙල් ඉදිරිපත් කළ ජනමාධ්‍යයේ කාර්යයන්

ලකුණු 4x2 =8

3. මාධ්‍ය විචාරයේ දී අවධානයට යොමු වන පහත කරුණු විස්තර කරන්න.

(අ) මාධ්‍ය හා දෛනික ජීවිතය

- පුද්ගල ආකල්ප වලට බලපෑම් කරයි.
- ග්‍රාහකයා තුළ ප්‍රචණ්ඩත්වය වර්ධනය කරයි.
- ග්‍රාහකයා තුළ වැරදි ආහාර පුරුදු ඇති කරයි.
- විලාසිතා අනුගමනය කිරීමට පොළොඹවයි.
- රස වින්දනය හැඩගස්වයි.
- දේශීයත්වයට වඩා බටහිර අංග ඇගයීමට පුරුදුවෙයි.
- විවේකය ගත කිරීමේ ඵලදායී පුරුදු වෙනස් වෙයි.

(ආ) ස්ත්‍රීවාදී විචාරය

- ස්ත්‍රී අයිතිවාසිකම් මත ලිංගිකත්ව සමානතා පදනමින් මාධ්‍ය විචාරය කිරීම

(ඉ) මාධ්‍ය හා මායාව

- මාධ්‍ය මගින් ගොඩනගන ජනමත මිත්‍යාව පිළිබඳ විස්තර කර තිබිය යුතුය

  (ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය මූලාශ්‍ර කර ගන්න)

ලකුණු 4x3= 12

4. සමාජ මාධ්‍ය මගින් සමාජයට සිදුවන අයහපත් බලපෑම අවම කිරීම සඳහා අනුගමනය කළ යුතු ආචාර ධර්ම හතරක් ඔබගේ යෝජනා ලෙස විස්තර කරන්න.

- සත්‍ය හා නිවැරදි තොරතුරු
- ලිංගිකත්වය හා අශ්ශීල අන්තර්ගතයන්
- ළමා අපයෝජනය
- ගැටුම්කාරී අන්තර්ගතයන්
- වෛරී ප්‍රකාශන
- පෞද්ගලිකත්වයට හානි පැමිණවීම

  ආදී කරුණු ඇතුළත් විය යුතුය

ලකුණු 4x4= 16